# මේ සිංහල
# අපගෙ රටයි?

'ලංකාව අයත්වන්නේ සිංහලයන්ටය. සුළුජාතීන් අනවශ්‍ය ඉල්ලීම් ඉදිරිපත් නොකළ යුතුය' යනුවෙන් හමුදාපති සරත් ෆොන්සේකා මහතා ළඟ දී කැනඩාවේ, පුවත්පතකට කළ ප්‍රකාශය මහත් ආන්දෝලනයකට තුඩු දී තිබේ. මුස්ලිම් කොංග්‍රසයේ නායක හකීම් මහතා, එජාපයේ, කබීර් හෂීම් මන්ත්‍රීතුමා, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ආචාර්ය සරවන මුත්තු සහ Sunday Leader පත්‍රයේ කතුවරයා, මේ ප්‍රකාශය ප්‍රසිද්ධියේ විවේචනය කර ඇති අයයි. දෙමළ ජාතික සන්ධානයද ඒ අදහසට දැඩි විරෝධය පළ කර ඇත. ආණ්ඩුවේ ප්‍රකාශක රඹුක්වැල්ල ඇමතිවරයා, තම අදහස් ප්‍රකාශ කිරීමට හමුදාපතිවරයාට ඇති අයිතිය ආරක්ෂාකර ඇති අතර, ආණ්ඩුවේ ප්‍රබල හවුල්කරුවෙකු වන ජාතික හෙළ උරුමයේ ප්‍රකාශකයෝ, හමුදාපතිගේ ප්‍රකාශනය මූලධර්මයක් වශයෙන්ද ආරක්ෂා කරති.

හමුදාපතිවරයා කර ඇති ප්‍රකාශනයෙන් කාරණා දෙකක් මතු වේ. පළමුවැන්න, හමුදාපතිවරයා 'දේශපාලන ප්‍රකාශයැ'යි හැඳින්විය හැකි ප්‍රකාශ කළ යුතුද? යන්නයි. දෙවැන්න, හමුදාපතිවරයා සුළුජාතීන් දෙවැනිකොට සළකන ප්‍රකාශ කිරීම වැරදි නේද? යන්නයි. මේ ප්‍රශ්න දෙකම ගැන එකිනෙකට පටහැනි ප්‍රවේශ දෙකක් තිබේ. පළමුවැනි ප්‍රශ්නය ගැන කථා කරන්නේ නම්, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ සාම්ප්‍රදායික මූලධර්ම විශ්වාස කරන අය කියන්නේ, හමුදාපතිවරයා 'දේශපාලන' ප්‍රකාශ කිරීම වැරදිය යන්නයි. එය වැරදිවන්නේ, දේශපාලන ප්‍රකාශ කිරීම දේශපාලනඥයින්ගේ කාර්යයක් මිස, හමුදා හෝ සිවිල් නිලධාරීන්ගේ කාර්යයක් නොවේය යන සාම්ප්‍රදායික ස්ථාවරයේ සිට බලන විටය. හමුදාපතිවරයා දේශපාලන ප්‍රකාශ කිරීම 'කමක් නැත' කියන අය එසේ කියන්නේ හමුදා ප්‍රධානීන් දේශපාලන අදහස් ප්‍රසිද්ධියේ ප්‍රකාශ නොකරන යල්පැනගිය යුගය දැන් අවසන් වී ඇත' යන තර්කය මත බව පෙනේ. ඔවුන් තවදුරටත් විශ්වාස කරන බව පෙනෙන්නේ හමුදා නායකත්වය ජනවාර්ගික ප්‍රශ්නය ගැන දේශපාලන තීරණවලට සහභාගිවන තත්ත්වයක් තුළ, සිවිල් - මිලිටරි ශ්‍රම විභජනය පිළිබඳ සාම්ප්‍රදායික මූලධර්මය දැන් අවසන් වී ඇති බවයි. දේශපාලන නායකයෝ යුද්ධය ගැන ප්‍රසිද්ධියේ කථා කරති. හමුදා නායකයෝ යුද්ධයේ දේශපාලනය ගැන ප්‍රසිද්ධ ප්‍රකාශ කරති. ඉතින් මේ 'මහින්ද චින්තනයේ' කාලයයි.

මේ තත්ත්වය ගැන දේශපාලන විග්‍රහයක් කරන කෙනෙකු විසින් කිව යුතු වන තවත් දෙයක් තිබේ. මා එය කියන්නේ, අංක රහිත සුදුවැන් රථයක් මගේ දොරකඩටද නොඑනු ඇත යන මෝඩ විශ්වාසයද ඇතිවය. 'කිව යුතු කාරණය නම්, වර්තමානයේ ඉදිරියට යන යුද්ධයේ පසුබිම තුළ ලංකාවේ සාම්ප්‍රදායිකව පැවති සිවිල් - මිලිටරි බලතුලනය වෙනස් වී ඇත යන්නයි. දැන් ආරක්ෂක අමාත්‍යාංශය හා ආරක්ෂක හමුදා සිටින්නේ සිවිල් දේශපාලනඥයින් 'යටතේ' නොවේ. සිවිල් දේශපාලන නායකයින්ට සමාන්තර බලයක් දරන බලකේන්ද්‍රයක් හැටියට ආරක්ෂක අමාත්‍යාංශය පත්වී ඇති තත්ත්වයක් තුළය. මගේ මේ නිරීක්ෂණය ගැන ගෝඨාභය රාජපක්ෂ හා සරත් ෆොන්සේකා යන මහත්වරුන් "Absolutely Right" යනුවෙන් කියනු ඇතැයි මට තදින්ම සිතේ. මගේ පසුගිය 'රාවය' ලිපියේ කියා තිබුණු පරිදි ලංකාවේ රාජ්‍යයේ ගුණාත්මක පරිවර්තනයක් පසුගිය අවුරුදු කිහිපය තුළ සිදුවෙමින් පවතී. එනම් 'ජාතික ආරක්ෂක රාජ්‍යයක්' (National Security State එකක්) බිහි වීමය. සාමාන්‍ය 'ප්‍රජාතන්ත්‍රවාදී' රාජ්‍යයක් ජාතික ආරක්ෂක රාජ්‍යයක් බවට පත්වන විට රාජ්‍යයේ අභ්‍යන්තර බලතුලනයේ වෙනසක් ඇතිවෙයි. එනම් සිවිල් දේශපාලනඥයින් හා ආරක්ෂක හමුදා ප්‍රධානීන්ද, සිවිල් දේශපාලන ආයතන හා ආරක්ෂක ආයතනද අතර සාම්ප්‍රදායිකව සිවිල් දේශපාලනඥයින්ට හා සිවිල් දේශපාලන ආයතනවලට වාසිදායකව තිබුණු බලතුලනය වෙනස් වීමයි. එය යළි සකස්වීමයි. මේ යළි සකස්වීම තුළ, එක්කෝ ආරක්ෂක ආයතනලට හා ආරක්ෂක හමුදා ප්‍රධානීන්ට, සිවිල් දේශපාලනඥයින් හා සිවිල් දේශපාලන ආයතන අභිබවා යන බලයක් ලැබේ. එසේ නැත්නම්, ඒවාට සමාන්තර වන බලයක් ලැබේ. ලංකාවේ දැනට සිදුවී ඇත්තේ මේ දෙකෙන් අභිබවා යෑම හෝ සමාන්තරවීම හෝ කවරක්ද යන්න ගැන පැහැදිලි මතයක් ප්‍රකාශ කිරීමට නම්, අප රටේ දැනට බිහිවෙමින් තිබෙන ජාතික ආරක්ෂක රාජ්‍යයේ ස්වභාවය ගැන අධ්‍යයනයක් කළ යුතුව තිබේ. මේ අතර, දැනට පැහැදිලිව පෙනෙන කාරණයක් නම්, ලංකාවේ රාජ්‍යයේ ස්වභාවය වෙනස් කිරීමක් තුඩු දී ඇති අලුත් 'බල හවුලක්' (Power bloc එකක්) ගොඩ නැඟී තිබෙන බවයි. ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධානීන්, හමුදා ප්‍රධානීන්, ජාතික හෙළ උරුමයේ නායකත්වය සහ විමල් වීරවංශ මහතාගේ නායකත්වයෙන් බිහි වූ, අලුත් ජාතික පෙරමුණු බල හවුලේ තීරණාත්මක ඍජු සාමාජිකයන්ය. එහි වක්‍ර සාමාජිකයෝ බොහෝ සිටිති. මට නම් පෙනෙන්නේ මේ බල හවුල, ලංකාවේ රාජ්‍යය, ආණ්ඩුකරණය හා දේශපාලනය යන මේවා අලුතෙන්ම සකස් කිරීමේ ව්‍යාපෘතියක යෙදී සිටින බවයි. මෙය සුළුපටු කාරණයක් නොවන බව 'රාවය' කර්තෘතුමාට පවා තේරුම් යා යුතු දෙයකි.

දෙවැනි කාරණය ගැන කෙටියෙන්වත් කතා කරමු. එනම් 'මේ සිංහල අපගේ රටයි' යන හමුදාපතිතුමාගේ ප්‍රකාශයේ දේශපාලන සන්දර්භයයි. පසුගිය අවුරුදු විසිපහ තුළ ලංකාවේ ජනවාර්ගික සිවිල් යුද්ධය සහ එහි දේශපාලනය ගැන ඇස් සහ කන් ඇරගෙන සිටි කෙනෙකු හැටියට, පහත සඳහන් නිරීක්ෂණය කිරීමට මා

කැමැතිය. එල්ටීටීඊයට හා ද්‍රවිඩ සටන්කාමී කණ්ඩායම්වලට විරුද්ධව යුද්ධය පවතින සෑම අවධියකම, ශ්‍රී ලංකාවේ රාජ්‍යය හා රාජ්‍ය යන්ත්‍රය සිංහල - බෞද්ධ වර්ගවාදී වී ඇත. මෙය ලංකාවේ පශ්චාත් - යටත් විජිත රාජ්‍යයේ සාමාන්‍ය හා 'ස්වභාවික' ගති ලක්ෂණයයි. මෙයින් රාජ්‍යය, යන්තම් හෝ වෙනස් වූයේ අවස්ථා දෙකකදීය. එනම් 1994-1996 අවුරුදු දෙකත් 2002-2003 අවුරුද්දත් යන කාල වකවානු දෙකයි. ඒ දෙකම ලංකාවේ පශ්චාත් යටත්විජිත හා සිවිල් යුද්ධ රාජ්‍යයේ සාමාන්‍ය ස්වභාවයෙන් පිට පැන්න අසාමාන්‍ය ව්‍යතිරේකයන් දෙකකි. සිංහල ජාතිකවාදී දේශපාලන පරිකල්පනයට අනුව ලංකාවේ රාජ්‍යය සිංහල - බෞද්ධ වර්ගවාදී එකකි. ඒ බව නැවත නැවතත් තම සොල්දාදුවන්ට මතක් කර දෙන්නේ නැතිව, ඔවුන් මරණය හා මාරාන්තික තුවාල සහතික කරන යුද පෙරමුණට යැවීමට ගෝඨාභය රාජපක්ෂ මහතාට හෝ සරත් ෆොන්සේකා මහතාට හෝ නොහැකිය. ලංකාවේ බොහෝ සිංහල දේශපාලන නායකයින්, සිංහල රාජ්‍ය නිලධාරීන්, සිංහල හමුදා නිලධාරීන්, සිංහල මාධ්‍යවේදීන් සිංහල විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඇත්තටම විශ්වාස කරන දෙය නම්, 'මේ සිංහල අපගෙ රටයි' යන්නයි. ඒ බව විශ්වාස නොකරන්නේ. සුළුජාතික ප්‍රජාව හා සිංහල සමාජයේ මාත් අයිති අතිශය අතළොස්සකි.

ඉතින්, සරත් ෆොන්සේකා මහතා කියා ඇත්තේ මිථ්‍යා දෘෂ්ටික අදහසක් නොවේ. මිථ්‍යා දෘෂ්ටික වන්නේ 'ශ්‍රී ලංකාව යනු බහුවාර්ගික, බහු සංස්කෘතික සහ බහුවිධවාදී දේශපාලන සමාජයක්යැ'යි මා වැනි අය කියන ප්‍රකාශයන්ය. ඉතින් මේ ගැන අප කළ යුත්තේ කුමක්ද? එය වනාහී ලංකාවේ දේශපාලන පරිවර්තනය පිළිබඳව ගැටලුවේ හරයටම යන ප්‍රශ්නයකි. එය වෙනම, දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ යුතු කාරණයකි. ■

**ජයදේව උයන්ගොඩ**

***රාවය - 2008 ඔක්තෝබර් 12***